


ප්‍රසුගිය ජූලි දහඅට වනද කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත් විමට යෙදුන ශ්‍රී ලංකා සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයීය උපාධි ප්‍රධානෝත්සවයේදී තවත් එක් සෞන්දර්යවාදී ගාන්ධර්වරයෙකු වෙනුවෙන් ආචාර්ය උපාධියක් පිරිනැමුණා. දර්ශන ශූරි සම්මාන උපාධිය ඃඇටරුඋ දං ඃදප්එදර දං ඡයසකදිදවයහ* නැතිනම් ඡදබදරසි ක්ෂ් නම් වූ මෙම උපාධිය පිරිනැමුණෝ ප්‍රවීණ සංගීතවේදී වික්ටර් රත්නායකයන්ට. ඒ සඳහා රත්නායකයන්ව නම් කළ වග හා ආරාධනා ද බව සැලවූ සැණින් ඒ පිළිබඳව විමසිලිමත් වුයෙමු අපි.

"අනේ මල්ලි ලිව්වට නම් කමක් නෑ , හැබැයි මගේ නමට මුලින් ඔය පදවි තානානාන්තර නම් අමුණාන්න ඕන නෑ. පියා දුන්න නම හොඳටෝම ඇති. මේ ගමන මේ තරමක් දුරට ආවේ ඒ නමින්නේ. " රත්නායකයන් අප හා දුරකථනයෙන් සම්බන්ධ වුයේ ඒ අයුරින්.

"මම ඉගෙනගත්තේ රජයේ කලායතනය, නැත්නම් හේවුඩ් එකමනේ දැන් ඔය විශ්ව විද්‍යාල මට්ටමට පත්වෙලා තියෙන්නේ. ඉතින් මං ඉගෙන ගත්ත ආයතනයෙන් පිරිනැමෙන දේ මට බොහෝම වටිනවා. ඒ නිසා මම ඒක බොහෝම ගෞරවයෙන් පිළිගන්නවා. ඒත් ඉතින් මගේ රසිකයෝ මාව කවදත් දැනගෙන හිටපු වික්ටර් රත්නායක නම මට හොඳටම ඇති.

අප මුලින්ම සම්බන්ධ වූ අවස්ථාව වන විට මාධ්‍ය සඳහා සාකච්ඡා පවත්වා නොතිබුනු නිසාවෙන් "සන්නස" වෙනුවෙන් ලිවීමට ඒ වනතුරු ඉවසන්නට සිදු වුයේ රත්නායකයන්ගේ ඉල්ලීමට අනුව. කෙසේ වුවද ආචාර්ය උපාධිය සඳහා කියැ-වෙන හේතු පාඨය අපගේ පාඨකයින් වෙනුවෙන් ඉදිරිපත් කිරීමට අවශ්‍ය වුයෙන් උපාධි ප්‍රධානෝත්සවය පැවැත්වෙන තුරුම ඉවසිලිමත් වීමට අපට සිදු වුවා. ආරාධනා ලැබ උත්සවයට සහභාගී වූ ප්‍රවීණ ගීත රචක ගීතනාත් කුඩලිගමයන්ට හේතු පාඨය ඇතුලත් මා හැඟි සමරු කළඹ අප වෙත ලබා දුන්නේය. ඒ වෙනුවෙ-න් කුඩලිගමයන්ට තුති.

සැබැවින්ම හේතු පාඨය පිටුවක් පුරා ලියැවුනා වූ දිගු සටනක් විය. "දේශ නේත්‍ර වික්ටර් රත්නායක මහතා " මැයෙන් යුත් එකී සටහන සමරු කළඹක් උකහා ලියා තබන්නෙමු. මෙලෙසින්,

"ඉන්දියාවේ මොහොමඩ් රාෆි හෝ ශ්‍රී ලංකාවේ එච්.ආර්. ජෝතිපාල මෙන් චිත්‍රයට පසුබිම් ගායකයෙකු නොවී හුදෙක් සරල ගී හා පර්යේෂණාත්මක ගී ගයමින් පුරා පනස් වරසක් තිස්සේ කිසියම් ශිල්පියෙකුට ජනප්‍රියත්වයේ එකම තලයක රැඳී සිටීමට ලැබී නම් එය මහත් භාග්‍යයක් බැව් පැවසිය යුතුය"

"ආදයම් අතින් අති සාර්ථක දැවැන්ත වානිජ චිත්‍රපට බහුලව තිරයට ආ හැටේ, හෑත්තෑවේ සහ අසූවේ දශකවල මුල් භාගයේදී සිනමා පසුබිම් ගායන ශිල්පීන් ශ්‍රාවකයා බැඳ තබාගත් යුගයෙන් ප්‍රවිෂ්ඨ වී පුරා හතලිස් පස් වසරක් සිනමාවෙන් පරිබාහිරව ගායකයෙකු හැටියට සිය පෞරුෂය ගොඩ නඟාගත් ශිල්පියෙකු සිටී නම් ඒ භාග්‍යවන්තයා වික්ටර් රත්නායකම බව මම කියමි." (2006 ජනවාරි මස 20 වැනි දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවති "දෙතොලග සිනහා" ගීතාවලිය දෙරට වැඩුමේ උත්සවය " තිස්ස අබේසේකර)

වික්ටර් යනු සරළ වින්දනය මඟින් ශාස්ත්‍රීය රුචිය වර්ධනය සඳහා රසිකයා ශ්‍රාණය කළ සංගීත ශිල්පියෙකි. උතුරු ඉන්දියානු සහ දකුණු ඉන්දියානු අනුකාරක ගීත රැල්ලට යටව තිබි රසික වින්දනය ස්වතන්ත්‍ර සුභායනීය අවස්ථාවක රඳවා තැබීමට වික්ටර් ලබාදුන් දයකත්වය අති විශිෂ්ඨය. එක් කලෙක පණ්ඩිත අමරදේවයන් ප්‍රමුඛ අතලොස්සක් ශිල්පීන් හා බැඳුනු අල්පතරයක් වූ රසික පිරිස මෙන්ම සුවහසක් වූ අනුකාරක රැල්ලේ සිටි රසික සමුහයා ද වික්ටර් විසින් සිය සංගීත ගෙත්තමෙන් හා මෝහනීය ස්වරයෙන් එක හුයෙකට බැඳ දමන ලද බව නොරහසකි.



වික්ටර්ගේ ගායන විලාශය, සංගීතය හදරන ආධුනිකයන් විමසිලිමත් විය යුතු අංගයක් බව මතක් කළ යුතුය. උදලු පහරට දෙකට කැපුනු පණුවන් මෙන් දඟලමින් වේදකා දෙවනත් කරන සම්ප්‍රදයක් මතුවෙමින් පවතින යුගයක වික්ටර්ගේ ගායන විලාශය අධ්‍යයනය කිරීම ආධුනික ශිල්පීන්ට සංගීත පාඩමකි. මුළු ආත්මයම ගීතයට කැටිකරන වික්ටර් පෙරදිග සංගීතයේ පවත්වා භාවමය වින්දනය පිළිබඳ මහඟු සංකේතයක් වෙයි. ගීතය ගයා හමාරා වනතුරුම සිය ධ්‍යානයෙන් මිදී නොයන හෙතෙම බොහෝ විට මිනිස් චින්ත සන්තානයේ ඇති සියුම් මනෝභාවයන් මුදා හරින ශාන්ති කර්මයක් ලෙස මහත් පරිණත ආකාරයකින් ගීතය උපයෝගී කරගන්නා ආකාරය අපට පෙනෙයි.

ගීතය ඔහුට හඬින් කරන අති සියුම් රංගනයක් ය. ගායනයේදී ඔහු වචන හසුරු-වන ආකාරය, වචනවල රැඳුණු සංවේදී ගුණ ඉස්මතුවන ආකාරයෙන් ඊට ජීවය කවන අයුරුත් එමගින් ශ්‍රාවකයා ප්‍රබල කම්පනයකට පත් කරලීමට ඔහු සමත්වන අයුරුත් විමසීමට ලක්කල යුතු කරුණුය. කටහඬින් කරන මේ රංගනයේ කූටප්‍රාප්තිය සිදුවනුයේ වික්ටර් ප්‍රේම ගීත ගායනය කරන විටය. පුරාන ආචාරීන් පවසන පරිදි ජන, ජනප්‍රිය මෙන්ම සම්භාවය යන අංගත්‍රයම වික්ටර් ස්පර්ශ කොට ඇති අපුරු ආකාරය කොතරම් විශ්මය ජනකද? ඔහු තරම් ගීත රචකයින් සමුදයකගේ ගී ගැයු ගායන ශිල්පියෙකු නොමැතිය. මේ වනවිට රචකයන් 150 කට අධික සංඛ්‍යාවකගේ පදමාලා ඔහුගේ මධුර ස්වරයෙන් ගායනය වී ඇති අතර , සමහර කවියක් රචනා පවා ඔහුගේ ගී තනු හා ගායනය විලාසය නිසාම ඉතා අලංකාර නිර්මාණ බවට පත්ව ඇති බව ඒවා වැඩිදුරටත් විමසා බැලීමේදී පෙනී යයි. සිය සංගීත භාවිතය තුළ ගායනය, මධුර තනු රචනය මෙන්ම චිත්‍රපට සංගීත අධ්‍යක්ෂණය යන ත්‍රිවිධ ක්ෂේත්‍රයම අතික්‍රමණය කොට ඇති ආකාරය විටෙක විශ්මය දනවයි. වික්ටර්ගේ චිත්‍රපට සංගීත භාවිතයේ අග්‍රඵලයක් වූ "සරුංගලේ" චිත්‍රපටිය මෙහිලා සඳහන් කල යුතුය. බැඳී ගිය ජාතික සබඳතා පිළිබඳව කතා කළ අපූර්ව චිත්‍රපටයත් වූ "සරුංගලේ සඳහා වික්ටර් නිර්භය සංගීත අත්හද බැලීමක් සිදුකොට තිබිණ. ද්‍රවිඩ ජනවහරේ එන නාදමාලා දකුණු ඉන්දියානු කර්ණාටක සංගීතය හා සම්මිශ්‍රණය කොට කතාවේ තේමාව වඩාත් උද්දීපනය කිරීමට ඔහු දැරූ වෑයම ප්‍රශස්තය.

සෞන්දර්ය විශ්ව විද්‍යාලයීය සංගීත පීඨයේ පීඨාධිපතිරවයා වන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කෝලිත භානු දිසානායකයන් කියු එකී දීර්ඝ සටහනට වික්ටර් රත්නායකයන් විසින් සිනමාව, වේදිකාව නාට්‍ය, ටෙලි නාට්‍ය, හා ගීත ක්ෂේත්‍රය සඳහා දුන් දයකත්වයේ තොරතුරු දත්තයන් මෙන්ම ලැබූ සම්මාන පිළිබඳව ද තොරතුරු ඇතුලත් සටහන නිමා කරමින් දිසානායකන් ලියන්නේ මෙලෙසින්ය.



"ඔහු වයලීන වාදකයෙක් හැටියට සංගීත ක්ෂේත්‍රයට පිවිසියේය. මිනිස් කටහඬට ඉතා සමීපතම සංගීත භාණ්ඩයක් වූ වයලීනයෙන් ලද ශික්ෂණය පසු කලෙක ඔහුගේ ගායන දිවියට විපුල අත්වැලක් විය. විශේෂයෙන් වයලීන වාදකයෝ ශ්‍රවණෝන්ද්‍රිය විනිශ්චය කොට නිවැරදි ස්වරස්ථාන සොයා ගැනිමට බුහුටි බවක් දක්වති. ඔවුන්ගේ ස්වර ශ්‍රාණය අතිශය තීක්ෂණය වයලින් වාදකයෙකු වූ වික්ටර් ගායකයෙකු හැටියට ප්‍රවිෂ්ට වීමේ දි ඉතාම නිවැරදි ස්වරයන්හි පිහිටා ගායනය කිරීමට අභ්‍යාසයක් ලද්දේ ඒ නිසාම විය හැකිය. කිසිවිටෙක අපස්වර නොගැයෙන මේ විශිෂ්ට ගායකයාගේ හඬ පසන් වසරක අභිමානය අපට කියා පායි"

දස දෙසින් ගලා ආ සුභපැතුම් අතරේ ඔරුවල එගොඩවත්තේ නිස්කලංක පරිසරයක පිහිටි සිය නව නිවහනේ විවේකීව සිටි රත්නායකයන් මුණ ගැසුණු අවස්ථාවේ මංජුසාවක බහාලූ සිය ආචාර්ය උපාධි සහතික පත්‍රය අප වෙත දැක්වූයේ හදපිරි සතුටිනි.

"විවේකීව ඉන්න මෙතෙන්ට ආවට තාමත් හරියාකාරව නොලැබුණේ විවේකයම තමයි.... " රත්නායකයෝ සිනාසුනහ. එද මෙදතුර තමන්ම තනු හා සංගීතය නිර්මාණය කරගෙන ගැයූ ගීත අතුරින් වඩාත්ම ප්‍රචලිත වූ ගීය ලෙසින් හැඳින්විය හැකි ගීයකින් මෙවර ගී සඳළුව නිමා වෙයි.

# ජයමංගල ගී ගැයුණා

අපි ඔක්කොම රජවරු ඔක්කොම වැසියෝ
තුන් සිංහලයෙ ම නෑදෑයෝ
අපි ඔකේකොම පියවරු ඔක්කොම
මව්වරු
තුන් සිංහලයෙම දූ දරුවෝ

ජය දද බන්දා - සිරි දුව කැන්දා
රුපු සෙන් ඔද තෙද සින්දා
හද අරවින්දා කර සිරි නනදා
පරගැති සිත ගත බින්දා

හිස මල් පිපුණා - හසරැල් නැගුණා
හද සෝ ගිනි දැල් නිවුණා
නෙතු කැන් දිළුණා - සිතුවැල් බැදුනා
ජය මංගල ගී ගැයුණා

**පද රචනය - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනිල්**




ඉවතලා විසිතුරු
රන් රිදී මුතු මැණික්
අබරණ ආයිත්තම්
චාම් සුදු සාළුවක් පැලඳ
රගන්නට තැත් කවයි
මගේ මේ ආදර ගීතය
විසිතුරු ආබරණ ආයිත්තම්
අනිසි බරක් මිස
අබිමානයක් නම් නොවෙයි
අද මගේ ගීයට

රන් රිදී මුතු මැණික්
විචිත්‍රත්වරෑයේ කිංකිණි හඬ නගා
අපේ එක්වීමේ සුන්දරත්වය
පළුදු කරවා
ඔබත් මමත්
අතරින් නැගෙනු ඇත
විසල් පවුරක්ව
ඔබේ ආදර
මිමිණුම වසාගෙන

මගේ කවිකම ඉතින්
කෝලව සැගවෙයි
ඔබ අබියස
කිවිඳුන්ගේ කිවිඳාණනි...

යදින්නෙමි අසරණව
මම ඔබේ පාමුල
දෙනෙත් අයා දල්වා
පුදන්නෙමි මා දිවිය
නැවුම් නොකැලැල්
බට දඬුවක් ලෙසින්

පුරවන්න එය ඔබේ
ජීවනයේ සංගීත ස්වරයෙන්
හැඬවෙන්න පිබිදෙන්න
මිහිරි ඉමිහිරි ගී රාව

*.*

My song has put off her adornments. She has no pride of dress and decoration. Ornaments would mar our union; they would come between thee and me; their jingling would drown thy whispers.

My poet's vanity dies in shame before thy sight. O master poet, I have sat down at thy feet. Only let me make my life simple and straight, like a flute of reed for thee to fill with music.

*රබින්ද්‍රනාත් තාගෝරයන්ගේ ගීතාංජලී කාව්‍යයේ ඉංග්‍රීසි පරිවර්තනයේ පද්‍යයන්හි අනුවර්තනයකි.*

රන්සිරිමල් ප්‍රනාන්දු